# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2056/41 - 2018 පෙබරවාරි මස 02 වැනි සිකුරාදා - 2018.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. ගරු අනිල් ගුණරත්න මැතිතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාර
2. ගරු ඇතාළඩ ආරච්චිගේ ගාමිණී රෝහන් අමරසේකර මැතිතුමා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාර
3. ගරු පියසේන රණසිංහ මැතිතුමා, මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාර
4. මල්ලවආරච්චිගේ දොන් ඇන්තනි හැරල්ඩ් මැතිතුමා, විශ්‍රාමලත් නියෝජ්‍ය විගණකාධිපති
5. වසන්තා ජයසීලි කපුගම ගීගනගේ මෙනවිය, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්

වෙත :

ශුභාශිංසන පූර්වකවයි!

මෙහි උපලේඛනයෙහි සඳහන් කර ඇති කාරණයට අදාළව සිදු කෙරී ඇතැයි කියනු ලබන අක්‍රමිකතා මගේ දැන ගැනීමට ලක් කරනු ලැබ ඇති හෙයින් ද ;

තවද, මේ අධිකාර පත්‍රය යටතේ වන ඉහත කී කාරණය විමර්ශනය සහ පරීක්ෂා කිරීමේ විෂයපථය මගින් තම ව්‍යවස්ථාපිත සහ නෛතික වගකීම් ක්‍රියාවෙහි යොදවන්නාවූ අදාළ බලධාරීන් කෙරෙහි කිසිදු ලෙසකින් බාධකයක් නොපැනවෙන බැව් සැලකිල්ලට ගැනෙන අතර මේ අධිකාර පත්‍රය ප්‍රකාර පවත්වනු ලබන විමර්ශනය සහ පරීක්ෂණය නොතකා අදාළ බලධාරීන්ට, බලපවත්නා ලිඛිත නීති ප්‍රකාර ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ග සලකා බැලීමටත්, හැකි සෑම විටකදීම, බලපවත්නා ලිඛිත නීති ප්‍රකාර ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ග ගැනීමටත් බලය පැවරෙන බව සැලකිල්ලට ගැනීමෙන් ද ;

මේ අධිකාර පත්‍රය යටතේ මේ විමර්ශනය සහ පරීක්ෂණය කරනු ලබනුයේ පොලීසිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ නීතිපතිවරයා ඇතුලු අදාළ බලධාරින් විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලබන යම් ක්‍රියාමාර්ගයන්ට අමතරව සහ ඒවා කෙරෙහි අගතියක් සිදු නොවන පරිදි බැව් සැලකිල්ලට ගැනීමෙන් ද ;

1A - G 26159 — 22 (2018/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තවද, මෙහි උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණය පිළිබඳව පරීක්ෂා කිරීම හා විමර්ශනය කිරීම සහ මෙකී උපලේඛනයෙහි සඳහන් කෙරුණු කාරණයට අදාළව සිදු කෙරුණු අක්‍රමිකතාවලට සම්බන්ධ වී ඇති තැනැත්තන් කිසිවකු වෙතොත් ඔවුන් හඳුනාගැනීම අවශ්‍ය වී ඇති හෙයින් ද ;

තවද, මෙහි ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණයට අදාළව සිදු කෙරුණු එබඳු අක්‍රමිකතා පිළිබඳව වගකිව යුතු කිසියම් තැනැත්තකු, තැනැත්තන් හෝ ආස්ථිත්‍යයන් වෙතොත් ඔවුන් හඳුනා ගැනීම අවශ්‍යව ඇති හෙයින් ද ;

තවද, මෙබඳු ක්‍රියාවන් ඉදිරියේදී යළි සිදු නොවීම සහතික කරගනු පිණිස කවර ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතුද යන වග නිශ්චය කරගැනීමට මේ අධිකාර පත්‍රයේ උපලේඛනයෙහි දක්වා ඇති එම කාරණය පිළිබඳව විමර්ශනය හා පරීක්ෂණ පැවැත්වීම ජාතික යහපත උදෙසා වන්නක් බැව් මගේ මතය වන හෙයින් ද ;

තවද, මෙහි ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණය පිළිබඳව විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කරනු පිණිස පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කරලීම අවශ්‍ය බැව් මගේ මතය වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය සහ විශ්වස්තතාව කෙරෙහි විශ්වසනය හා අචල විශ්වාසය තබමින්, සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරිය) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී ;

1. ගරු අනිල් ගුණරත්න මැතිතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාර
2. ගරු ඇතාළඩ ආරච්චිගේ ගාමිණී රෝහන් අමරසේකර මැතිතුමා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාර
3. ගරු පියසේන රණසිංහ මැතිතුමා, මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාර
4. මල්ලවආරච්චිගේ දොන් ඇන්තනි හැරල්ඩ් මැතිතුමා, විශ්‍රාමලත් නියෝජ්‍ය විගණකාධිපති
5. වසන්තා ජයසීලි කපුගම ගීගනගේ මෙනවිය, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කර, පරීක්ෂා කොට වාර්තා කරනු පිණිස මගේ කොමසාරිස්වරුන් ලෙස මෙමගින් පත්කරමි ;

(අ) මෙහි උපලේඛනයෙහි සඳහන් කෙරුණු කාරණයට අදාළව සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම (මෙහි මින් මතු "ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්" යනුවෙන් සඳහන් කරනු ලබන) සී/ස ශ්‍රී ලංකන් කේටරිං සමාගම (මෙහි මින් මතු "ශ්‍රී ලංකන් කේටරිං" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ සී/ස මිහින් ලංකා පුද්ගලික සමාගම (මෙහි මින් මතු "මිහින් ලංකා" යනුවෙන් සඳහන් කරනු ලබන) යන ආයතනයන්හි කළමනාකරණය, පරිපාලනය සහ කටයුතු මෙහෙයවීම

(ආ) රජයට, කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා ඇතුලු වෙනත් කිසියම් ආස්ථිත්‍යයකට සෘජු හෝ ආරෝපිත අලාභයක්, හානියක් හෝ හානිකර ප්‍රතිඵලයක් ගෙන දෙමින් මෙහි උපලේඛනයෙහි සඳහන් කෙරුණු ඉහත කී කාරණයට අදාළව එම කළමනාකරණය, පරිපාලනය හා කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් අවපරිචයක්, අක්‍රමිකතාවක් හෝ අදාළ නිසි කාර්ය පරිපාටීන්ට අනුකූලව ක්‍රියානොකිරීමක් හෝ නිසි ආර්ථික සහ මූල්‍ය විචක්ෂණභාවය, ප්‍රතිමානයන්, මාර්ගෝපදේශ, පරිපාටීන් සහ භාවිත කළ හැකි ප්‍රශස්ථ පරිචයන් නොසලකා හැරීමක් සිදු වී තිබේද යන වග සහ එවැනි අලාභයන්හි ස්වභාවය හා ප්‍රමාණය ;

(ඇ) රජයට, කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා ඇතුලු වෙනත් කිසියම් ආස්ථිත්‍යයකට සෘජු හෝ ආරෝපිත අලාභයක්, හානියක් හෝ අනර්ථයක් ගෙන දෙමින්, ඉහත කී උපලේඛනයෙහි සඳහන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා සමාගම් වලට අදාළව වංචනිකව, අනවධානීව, නොසැලකිලිමත් ලෙස, විචක්ෂණභාවයෙන් තොරව හෝ වගකීම් විරහිතව, පිළිගත් ප්‍රතිමානයන්, මාර්ගෝපදේශ හෝ ප්‍රශස්ථ පරිචයන් සලකා බැලීම කෙරෙහි පැවැතිය යුතු නිසි වෘත්තීය ආරක්ෂාවෙන් හෝ නිසි සම්ප්‍රජන්‍යතාවයෙන් තොරව මෙහි උපලේඛනයෙහි සඳහන් කෙරුණු ඉහත කී කාරණයට අදාළව යම් ගිවිසුම්කාරී බැඳීමකට ඇතුළත්විණි ද යන වග ;

(ඈ) රජයට, කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා ඇතුලු වෙනත් කිසියම් ආස්ථිත්‍යයකට ප්‍රශස්ථ ප්‍රතිලාභ ගෙනදීම සහතික කරගනු පිණිස මෙහි උපලේඛයෙහි සඳහන් කෙරුණු ඉහත කී කාරණයට අදාළව නිසි ආර්ථික සහ මූල්‍ය විචක්ෂණභාවය, ප්‍රතිමානයන්, මාර්ගෝපදේශ, පරිපාටීන්, ප්‍රශස්ථ පරිචයන් සහ ප්‍රමාණවත් ආරක්ෂක පියවර ගනු ලැබ තිබේද යන වග ;

(ඉ) ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණය සම්බන්ධයෙන් රජයට, කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා ඇතුලු වෙනත් කිසියම් ආස්ථිත්‍යයකට සෘජු හෝ ආරෝපිත අලාභයක්, හානියක් හෝ අනර්ථයක් සිදු කිරීමට තුඩුදුන් ක්‍රියාව, අත්හැරීමක් හෝ ක්‍රියාකලාපයක් සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් ;

(ඊ) ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණය පිළිබඳව යම් පරීක්ෂණයක් හෝ විමසා බැලීමක් පැවැත්වීමට යම් ආකාරයකින් අවහිර කිරීමක් හෝ වළක්වාලීමක් සිදුවීම හේතුවෙන් රජයට, කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා ඇතුළු වෙනත් කිසියම් ආස්ථිත්‍යයකට සෘජු හෝ ආරෝපිත අලාභයක්, හානියක් හෝ අනර්ථයක් සිදු වී තිබේද යන වග සහ, එසේ සිදු වූයේ නම් එබඳු අවහිර සිදු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් ;

(උ) රජයට, කිසියම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට හෝ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා ඇතුළු වෙනත් කිසියම් ආස්ථිත්‍යයකට ප්‍රශස්ථ ප්‍රතිලාභ අත්කර ගැනීමේ අරමුණින් විනිවිදභාවයෙන්, නිසි වෘත්තීය ආරක්ෂාවෙන් සහ වගවීමෙන් යුතුව මෙහි උපලේඛනයේ සඳහන් කෙරුණු කාරණයට අදාළව ඉදිරියේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටීන් හා මාර්ගෝපදේශ ;

(ඌ) ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණයට අදාළව බලය අවභාවිතය සහ අනිසි ලෙස යෙදවීම, බලපෑම, අතුරුබාධනය, වංචාව, දූෂණය සහ ඥාති සංග්‍රහය හෝ වෙනත් යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සිදුව තිබේද යන වග ;

(එ) මේ අධිකාර පත්‍රයෙහි නියමයන් යටතේ පරීක්ෂණයට හෝ විමර්ශනයට භාජන කරනු ලැබ ඇති ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු එකී කාරණයට අදාළව නිර්දේශ ඉදිරිපත් කරලීම.

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ඉහත කී ගරු අනිල් ගුණරත්න මැතිතුමන් වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, ඉහත කී උපලේඛනයෙහි සඳහන් පූර්වෝක්ත කාරණයට අදාළව ඔබට අවශ්‍ය යයි පෙනීයා හැකි පරිදි සියලුම පරීක්ෂණ පැවැත්වීමටත් සෙසු සියලුම විමර්ශනයන් කිරීමටත්, ඉහත කී කොමසාරිස්වරුන්ට මා මෙයින් බලය හා අධිකාරිය පවරන අතර, මේ අධිකාර පත්‍රයෙහි දින සිට මාස හයක් (06) ඇතුළත ඔබගේ පරීක්ෂණයන්හි සහ විමර්ශනයන්හි නිගමන හා ඒවාට අදාළ ඔබගේ නිර්දේශ ගෙනහැර දක්වමින් වාර්තාවක්/වාර්තා ඔබගේ අත්සනින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස ඔබතුමන්ලාහට මම මෙයින් නියම කරමි.

තවද, ඉහත කී උපලේඛනයෙහි සඳහන් කෙරුණු පූර්වෝක්ත කාරණයට අදාළ යම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතුයැයි මම මෙයින් නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන් හි හෝ පරීක්ෂණයන් හි කාර්යයන් අරබයා ඔබ විසින් සහය හෝ තොරතුරු ඉල්ලා සිටිනු ලැබිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධානය කරමි.

තවද, ඉහත කී පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 14 වන වගන්තියේ විධිවිධාන මෙම කොමිෂන් සභාවට අදාළ විය යුතු බැව් මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහඅටක් වූ ජනවාරි මස 31 වන දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ඔස්ටින් ප්‍රනාන්දු,
ජනාධිපති ලේකම්.

උපලේඛනය

2006 ජනවාරි මස 01 වැනි දින සිට 2018 ජනවාරි මස 31 වැනි දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මතු දැක්වෙන කරුණු වලට අදාළව සී/ස ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම (මෙහි මින් මතු "ශ්‍රී ලංකන් එයාලයින්ස්" යනුවෙන් සඳහන් කරනු ලබන) සී/ස ශ්‍රී ලංකන් කේටරිං සමාගම (මෙහි මින් මතු "ශ්‍රී ලංකන් කේටරිං" යනුවෙන් සඳහන් කරනු ලබන) සහ සී/ස මිහින් ලංකා (පුද්ගලික) සමාගම (මෙහි මින් මතු "මිහින් ලංකා" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්බන්ධයෙන් සිදු කරන ලදැයි කියන අක්‍රමිකතා ;

(අ) මහා භාණ්ඩාගාරය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ යම් වෙනත් මූල්‍ය ආයතනයක් හෝ ආස්ථිත්‍යයක් විසින් මූල්‍ය සම්පත් යෙදවීම ඇතුලුව කොටස් ප්‍රාග්ධනය සහ ණය ගැනීම් මාර්ගයෙන් අරමුදල් යෙදවීම සහ එබඳු අරමුදල් ආයෝජනය කිරීම.

(ආ) මිහින් ලංකා සමාගම ස්ථාපිත කරලීම, මෙහෙයුම් සහ නිමාකරලීම.

(ඇ) ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජාත්‍යන්තර ගුවන් සමාගම වන එමිරේට්ස් එයාර්ලයින්ස් සමාගම අතර එළඹි ගිවිසුම් අවසන් කරලීම, සහ ඊට හේතුන් සහ එහි සංකීර්ණ ප්‍රතිඵල.

(ඈ) ගුවන් යානා සහ යම් වෙනත් වත්කම් මිලදී ගැනීම, විකිණීම, බදුදීම, විකිණීම සහ ආපසු බද්දට ගැනීම, පැවරුම, හුවමාරුව, මුදාහැරීම සහ බැහැර කිරීමට අදාළ ගිවිසුම් වලට එළඹීම, දීර්ඝ කිරීම, සහ අවලංගු කරලීම.

(ඉ) වටිනාකම රු. මිලියන 50 ඉක්මවන ගුවන්යානා සහ යම් වෙනත් වත්කම් මිලදී ගැනීම, විකිණීම, බදුදීම, විකිණීම හා ආපසු බද්දට ගැනීම, පැවරුම, හුවමාරුව, මුදාහැරීම සහ බැහැර කිරීම ඇතුලුව භාණ්ඩ හා සේවාවන් ප්‍රසම්පාදනය සහ ගුවන්යානා සමූහය නැවත පිහිටුවීම (re-fleeting)

(ඊ) භාණ්ඩ, සේවා හෝ යම් වෙනත් කර්තව්‍යයක් සැපයීම සඳහා අනුයෝජිතයින්, තැරැව්කරුවන්, උපදේශකවරුන්, සමාගම් සහ යම් වෙනත් පුද්ගලයකු හෝ ආස්ථිත්‍යයක් බඳවාගැනීම සහ පත්කරලීම.

(උ) අනෙකුත් රටවල්හි මාර්ග ජාලය සහ කාර්යාල විවෘත කරලීම, නඩත්තුව සහ අත්හිටුවාලීම.

(ඌ) ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරිං සහ මිහින් ලංකා යන සමාගම් අතර ගණුදෙනු.

(එ) බඳවාගැනීම, පත්කරලීම, පාරිශ්‍රමිකය, උසස් කිරීම, ස්ථාන මාරුව, සේවක අපවර්තනය සහ විශ්‍රාම ගැන්වීම, අධ්‍යක්ෂ මණ්ඩල, ප්‍රධාන විධායක නිලධාරීන්, සභාපතිවරුන් සහ සෙසු ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පත් කරලීම ඇතුළුව මානව සම්පත් කළමනාකරණය.

(ඒ) මූල්‍ය වාර්තාකරණය, අදාළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම, සහ මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධනය සහ තත්ත්වය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.